**ශීර්ෂය 101 - බුද්ධශාසන අමාත්‍යාංශය**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බුද්ධශාසනඅමාත්‍යාංශයේ2018දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බුද්ධශාසන අමාත්‍යාංශයේමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයටඅදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරීවෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන අමාත්‍යාංශයේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේමූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේඅභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) බුද්ධශාසන අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළවමූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේඅවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකිවිය.

## 1.6 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

### 1.6.1 <u>ගිණුම් ඉදිරිපත් කිරීම</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති 267/2018 අංක දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සිංහල, ඉංග්‍රීසි හා දෙමළ යන භාෂාත්‍රයෙන් ඉදිරිපත් කළ යුතු වුවද, අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දෙමළ අනුවාදනය ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන කට්ටල භාෂා ත්‍රිත්වයෙන් ඉදිරිපත් කළ යුතු වීම. | දෙමළ බසින් පරිවර්තනය කිරීම සඳහා බාහිර පාර්ශවයක් වෙත යොමු කර ඇති අතර ඉදිරියේදී නොපමාව ඉදිරිපත් කරමි. |

### 1.6.2 <u>පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල නොවීම</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍යප්‍රකාශනවල ඉකුත් වර්ෂයේ අනුරූපී සංඛ්‍යා දැක්විය යුතු වුවත්, අමාත්‍යාංශයේ මූල්‍යප්‍රකාශනවල ඉකුත් වර්ෂයේ අනුරූපී සංඛ්‍යා දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මකභාවය සඳහා ඉකුත් වර්ෂයේ අනුරූපී සංඛ්‍යා ඉදිරිපත් කළ යුතු වීම. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2018 මූල්‍ය වර්ෂය සඳහා නව ආකෘතියක් හඳුන්වාදුන් අතර ඒ අනුව ප්‍රවර්තන වර්ෂයේ අගයන් පමණක් පදනම් කර ගනිමින් ගිණුම් ඉදිරිපත් කරන ලදී. |

### 1.6.3 <u>අත්තිකාරම් ගිණුම් ශේෂ</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වර්ෂ 3කට වැඩි කාලයක සිට වැඩ තහනමට ලක් වූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.32,155 ක් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | අයකර ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතු වීම. | වැඩ තහනමකට ලක් වූ නිලධාරීයගේ හිඟ ණය ශේෂය පියවන ලෙසට දැනුවත් කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රසූත නිවාඩු ලබාගෙන සිටි -එම- නිළධාරිනියක විසින් වැටුප් රහිතනිවාඩුලබාගෙනතිබුමාස 3ක්සඳහාඅයවියයුතුරු.10,757 ක්වූණයවාරිකඅයකරගෙනනොතිබුණි. | | වැටුප් රහිත නිවාඩු ලබා සිටි නිලධාරිනියගෙන් අයවිය යුතු හිඟ ණය වාරික හා පොලිය පියවන ලෙසට නිලධාරිනිය දැනුවත් කර ඇති අතර ඉදිරියේදී අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |

### 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 5,708,192 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.47,104,906 ක් වූ තැන්පතු ශේෂවලින් වර්ෂ 2 ක ඉක්ම වූ එකතුව රු.5,708,192 ක් වූ ශේෂ සඳහා මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | වර්ෂ 2 ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වර්ෂ 2 ඉක්මවූ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 2ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 4ක් වෙන්කර තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක එකතුව රු.මිලියන 121.23 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | වර්ෂයේ අවශ්‍යතාවය නිසි පරිදි පුරෝකථනය කර අරමුදල් ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කළ යුතු වීම. | ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම, වියදම් ඉල්ලුම් නොකිරීම ආදී කරුණු මෙම ඉතිරිවීම්වලට හේතුවිය. |

**2.2** <u>බැරකම් හා බැඳීම්වලට එළඹීම</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වැය විෂයය 5 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල එකතුව රු.මිලියන 28.35 ක බැරකම් හෙළිදරව්කර තිබුණද, එය බැරකම් ලේඛනයෙහි සටහන්කර නොතිබුණි. | බැරකම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතු වීම. | 2018 අවසන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති බැරකම් විස්තර අතපසුවීමකින් බැරකම් ලේඛනයේ සටහන් කර නැත. |

**3.** <u>තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**විගණන නිරීක්ෂණය**

“තිරසාරසංවර්ධනයපිළිබඳඑක්සත්ජාතීන්ගේවසර 2030 න්‍යායපත්‍රය”අනුව කටයුතුකලයුතුවපවතිනඅතරසමාලෝචිතවර්ෂයටඅදාලවඅමාත්‍යාංශයවිසින්තමවිෂයපථයයටතේවනකාර්යයන්සම්බන් ඉලක්කහා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම මැන බැලීම හඳුනාගැනීමටකටයුතුකරනොතිබුණි.

**4.** <u>මානව සම්පත් කළමනාකරණ</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 75 ක් පැවති අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අවශ්‍ය අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතු වීම. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලෙසට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත් මෙතෙක් සම්පූර්ණ වී නැත. |